# විද්‍යා සන්නිවේදනය හරිහැටි...

වැනි පිටුවෙන්

විද්‍යාව කියන්නේ පර්යේෂණාගාර වත්, තාක්ෂණය කියන්නේ ගැජට් වත් නො වේ. මෙසේ පටු ලෙස විග්‍රහ නො කර පුළුල් අරුතින් ගත් කල ඉතිහාසය පුරා ම පැවත එන දැනුම ගවේෂණයේ පැතිකඩ අපේ විද්‍යා සන්නිවේදනයන්ට කාලීන හා තර්කානුකූල ලෙසින් අදාළ කරගත හැකියි. එහි කිසිදු වරදක් හෝ නො ගැලපීමක් හෝ නැහැ.

එනමුත් සිහිනෙන් දුටු දෙයක් හෝ ගුප්ත බලවේගයකින් පෙන්වා දුන් දෙයක් හෝ පදනම් කරගනිමින් සහ එම මූලාශ්‍ර අන් අයට ගෝචර නො වන නිසා ඒ ගැන ප්‍රශ්න කිරීමට නො එන ලෙස ද වැඩිදුරටත් සඳහන් කරමින් අදහස් පළ කිරීම වගේ දේ නම් විද්‍යා සන්නිවේදනයට එකඟ නැහැ.

### ✹ එදාට සාපේක්ෂව අද විද්‍යා ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ ලෝක ප්‍රවණතා මොනවා ද?

නව මාධ්‍යය (New media) කියන සංකල්පය හරහා සමස්ත ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ ම නව මානයන් දැන් බිහි වෙමින් තිබෙනවා. දෙවැනි පරපුරේ වෙබ් ප්‍රකාශන (Web 2.0) ලෙසිනුත් මෙය හඳුන්වනවා. සමාජ ජාල වෙබ් අඩවි කියා හඳුන්වන්නෙත් මේ ප්‍රවණතාවයි. එක අතකින් විද්‍යාඥයන් සාම්ප්‍රදායක ජනමාධ්‍ය මත නො යැපී සෘජුව ම බ්ලොග්, ෆේස්බුක්, ට්විටර් වැනි සමාජ ජාල මාධ්‍ය හරහා පොදු ජනතාවට සිය පර්යේෂණ තොරතුරු හා පණිවිඩ ගෙන යමින් සිටිනවා. ඔවුන් සමග සංවාදයේ යෙදෙනවා.

අනෙක් අතින් සාම්ප්‍රදායික ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ නියැළි විද්‍යා මාධ්‍යවේදීන් ද නව මාධ්‍යය වෙත යොමු වෙමින් සිටීමේ ප්‍රවණතාවක් දක්නට ලැබෙනවා. එයට හේතුව සාම්ප්‍රදායික මාධ්‍ය තුළ ඔවුන් ගේ තැන අහිමි වීම. විශේෂයෙන් ම CNN වැනි ප්‍රධාන ප්‍රවාහයේ ජනමාධ්‍ය ආයතන වියදම් කපා හැරීමේ පියවරක් ලෙස පරිසර, සෞඛ්‍ය හා විද්‍යා මාධ්‍යවේදීන් සේවයෙන් ඉවත් කරමින් සිටිනවා. ඉතින්, ටෙලිවිෂන් එකේ සේවය කළ මාධ්‍යවේදීන් යූ ටියුබ් වැනි වෙබ් මාධ්‍ය හරහාත් මුද්‍රිත මාධ්‍යයේ සේවය කළ අය බ්ලොග් හා ට්විටර් හරහාත් මාධ්‍යකරණයේ යෙදෙන්නට පටන් අරගෙන. හැබැයි තවමත් නව මාධ්‍යය සඳහා වෙළෙඳපොළ ආකෘති හැදිල නැහැ. ඒ කියන්නේ ජීවත් වීම සඳහා වෘත්තියක් ලෙස මේ මාධ්‍ය සකස් වෙලා නැහැ.

මෙවන් ප්‍රවණතා හේතුවෙන් ජනමාධ්‍ය හෝ ජනමාධ්‍යවේදීන් හෝ මේ යැයි කියා ඉරි ගසා වෙන් කර පෙන්වීම අසීරු තත්ත්වයක් දැන් උදා වෙමින් තිබෙනවා. ටෙලිවිෂන් හෝ රේඩියෝ මාධ්‍ය තවදුරටත් විද්‍යුත් මාධ්‍ය ද නැතිනම් ඩිජිටල් මාධ්‍ය ද යන්න වෙන් කර දැක්වීමටත් දැන් අසීරුයි. මොකද විද්‍යුත් මාධ්‍යවල ඩිජිටල් (වෙබ්) විකාශනයකුත් තිබෙන නිසා.

ජනමාධ්‍ය ක්ෂේත්‍රය බලා සිටිය දී වේගයෙන් පරිණාමය වෙමින් තිබෙනවා.